All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහනුවර
மத்திய மாகாண கல்வித்திணைக்களம் - கண்டி
CENTRAL PROVINCIAL DEPARTMENT OF EDUCATION - KANDY

5 ශ්‍රේණිය
සිසු නිපුණතා ඇගයීමේ පරීක්ෂණය
2025 මැයි
1 පත්‍රය

නම.....

කාලය පැය 1 යි

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්


* ඔබේ **නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **නම** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* කටු වැඩ සඳහා කඩදාසියක් යොදා ගන්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	


- **පහත රූප අතරින් වෙනස් රූපය තෝරන්න**

1.



(1) (2) (3)


2.



(1) (2) (3)

- **මුලින් දී ඇති රූපය සම්පූර්ණ කිරීමට ගැළපෙන කොටස තෝරන්න.**


3.



(1) (2) (3)


- පහත දක්වා ඇති රූප පැහැදිලි කාණ්ඩ 3 කට වෙන් කළ හැකි ය.

4.




එම කාණ්ඩ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.


(1)



(2)



(3)



නම.....

5. වචන කිහිපයකට ආදේශ කර ඇති ඉලක්කම් පහත දැක්වේ.

වරහන	වියදම	සටහන
3 4 5 7	2 1 6 8	9 0 57

ඒ අනුව " **සරඳුම** " යන වචනය ඉලක්කම්වලින් ලියා ඇති නිවැරදි පිළිතුර තෝරන්න.


(1) 3 812 (2) 9 468 (3) 6 432

6. උදෑසන ක්‍රීඩා පිටියට ගිය පසිඳු , A සිට B දෙසට දිවයන විට ඔහුගේ සෙවණැල්ල වැටී තිබුණේ ඔහුට පිටුපසිනි. පසිඳු, B සිට C දෙසට දිවයන විට සෙවණැල්ල වැටී තිබුණේ ඔහුගේ,

(1) දකුණු පසිනි

(2) වම් පසිනි

(3) ඉදිරියෙනි




7. එක් ගණිත ගැටලුවක් සංකේතවලින් පහත දැක්වෙන පරිදි ලියා තිබුණි. ඒ අනුව  සංකේතයේ අගය වන්නේ,



(1) 3 (2) 1 (3) 2

8. පහත රූපයේ ඵළවළු, පලතුරු හා අන්නාසි පෙන්නුම් කරයි. R මගින් පෙන්නුම් කරන්නේ කුමක් ද?




(1) ඵළවළු

(2) පලතුරු

(3) අන්නාසි

9. මෙහි දැක්වෙන්නේ ගඩොල් ගොඩකි. එහි ඇති ගඩොල් ගණන කොපමණ ද ?



(1) 14


(2) 15

(3) 16

10. ධාරිතාව ලීටර 15 වන භාජනයක් ජලයෙන් පිරවීමට අක්කා ලීටර 2 ක බෝතලයකින් ජලය පුරවයි. ජලය දමන සෑම වාරයක දී ම මල්ලි ලීටර 1ක බෝතලයකින් ජලය ඉවත් කරයි.භාජනය සම්පූර්ණයෙන් ම පිරවීමට කොපමණ වාරයක් ජලය දැමිය යුතු ද ?

(1) 12 වාරයක් (2) 13 වාරයක් (3) 14 වාරයක්


11. දී ඇති රූපය සමචතුරස්‍රයක් කිරීමට අවශ්‍ය අවම කොටු ගණන කීය ද ?



(1) 9 (2) 6 (3) 7

- සංඛ්‍යා යෙදී ඇති රටාව තේරුම් ගෙන හිස්තැනට අදාළ සංඛ්‍යාව තෝරන්න.


12.



(1) 18 (2) 26 (3) 30

13. රූපයේ A කොටුවේ සිට B කොටුවට පහත දී ඇති කොන්දේසි අනුව ගමන් කළ යුතු ය.

A කොටුවෙන් ආරම්භ කළ යුතු ය.
සෑම විට ම යාබද කොටුවක් හරහා ගමන් කළ යුතු ය.
පහළ කොටුවකට පැමිණි විට යළි ඉහළ කොටුවකට ගමන් කළ නොහැකි ය.



මේ අනුව A කොටුවේ සිට B කොටුවට ගමන් කළ හැකි උපරිම මාර්ග සංඛ්‍යාව කීය ද?

(1) 4 (2) 8 (3) 10

14. සඳුනි ළඟ නෝට්ටු 7කින් රුපියල් 840.00 ක් තිබේ. ඇය ළඟ ඇති මුදල් නෝට්ටු විය හැක්කේ,

(1) රුපියල් සියයේ නෝට්ටු 3ක්, රුපියල් පනහේ නෝට්ටු 2ක්, රුපියල් පන්සියයේ නෝට්ටු 2ක්
(2) රුපියල් සියයේ නෝට්ටු 2ක්, රුපියල් පනහේ නෝට්ටු 4ක්, රුපියල් පන්සියයේ නෝට්ටු 1ක්, රුපියල් විස්සේ නෝට්ටු 4ක්
(3) රුපියල් සියයේ නෝට්ටු 2ක්, රුපියල් පනහේ නෝට්ටු 2ක්, රුපියල් පන්සියයේ නෝට්ටු 1ක් රුපියල් විස්සේ නෝට්ටු 2 ක්


15. ළමයෙක් ඡායාරූපයක් පෙන්වා මෙසේ කිය යි. මේ ඡායාරූපයේ සිටින පුද්ගලයාගේ පියා මගේ අම්මාගේ ද පියා ය. එසේ නම් මේ ඡායාරූපයේ සිටින පුද්ගලයා ළමයාගේ කවුද ?

(1) ලොකු නාත්තා (2) බාප්පා (3) මාමා

16. සමන් සිටි පෝලිමක ඔහුට ඉදිරියෙන් 9 දෙනෙකු සිටී. කිසියම් හේතුවක් නිසා පෝලිමේ අන්තිමට සිටින කෙනා පළමු වැනියා වනසේ සියලු දෙනා ම අනෙක් පසට හැරුණේ ය. එවිට සමන් ට ඉදිරියෙන් සිටියේ හය දෙනෙකි. එසේ නම් පෝලිමේ සිටින මුළු ගණන කීය ද ?

(1) 15 (2) 16 (3) 17

17. රූපවල දැක්වෙන පරිදි කඩදාසියක් තිත් ඉර දිගේ දෙකට නවා කොළ දෙක ම සිදුරුවන ලෙස සිදුරු කරන ලදී.



එය නැවතත් පෙර තිබූ ලෙස දිග හැරිය විට දැකිය හැකි ආකාරය වන්නේ,



(1) (2) (3)

18. මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් ම සමත් වන බව ළමයෙක් පැවසුවේ ය. ඔහු එසේ පැවසීමට හේතුව විය හැක්කේ,

(1) ශිෂ්‍යත්ව විභාගය ඉතා පහසුවෙන් ජයග්‍රහණය කළ හැකි නිසා ය.

(2) විභාගය මෙවර කල් දමා ඇති නිසා ය.

(3) ඔහු විභාගය හොඳින් පාඩම් කර සූදානම් වී ඇති නිසා ය.

19. රටාව හඳුනාගෙන හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න.

3	3	5	3	4	3	6	3
36		64		49		.....	

(1) 56 (2) 81 (3) 96

20. පෙරේදා බ්‍රහස්පතින්දා ය. අනිද්දා කොළඹ යාමට රාජු සූදානමින් සිටියි. ඔහු කොළඹ යන දවස කුමක් ද?

(1) ඉරිදා (2) සඳුදා (3) බ්‍රහස්පතින්දා


21. පන්තියේ ගුරු මේසයට මල් බඳුනක් ගෙනෙන්නේ කවුරුන්දැයි ඇසූ විට පවන්, දුලාන්, චමත් යන තිදෙනා ම තමා එය ගෙනෙන බව කියමින් අත එසවූහ. නමුත් ඊළඟ දිනයේ දී කිසිවකු මල් බඳුන ගෙනවිත් තිබුණේ නැත. මේ සඳහා ගැළපෙන ප්‍රස්තාව පිරුළ කුමක් ද?

(1) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ

(2) ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ

(3) කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

22. හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.



(1)  (2)  (3) 

23 කවියක පද පේළි හතරක් මාරු කර ලියා ඇති අයුරු පහත දැක්වේ.

A - මහළු කෙනෙක් බස් රථයට

B - ඔබේ අසුන එවැනි අයට

C - අමාරුවෙන් ගොඩ වුණු විට

D - දීමයි යුතුකම සැම විට

අර්ථවත් කවියක් ලැබෙන සේ ගැළපූ විට එම පද පේළිවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

(1) A,D,C,B ය. (2) C,B,A,D ය. (3) A,C,B,D ය.

24. චරිත්ගේ නිවසේ සිට පුස්තකාලයට ඇති දුර මීටර 600 කි. ඔහු එම මුළු දුරෙන් හරි අඩක් පුස්තකාලය දෙසට ගොස් නැවතත් නිවසට පැමිණ නැවත පුස්තකාලයට ගියේ ය. ඔහු ගමන් කළ මුළු දුර,

(1) මීටර 1800 කි. (2) මීටර 1200කි. (3) මීටර 600කි.

- **ළමයකු සතියේ දින හත තුළ දී අඳින ලද ඇඳුම් පිළිබඳ විස්තරයක් පහත දැක් වේ.**

සඳුදා	අඟහරුවාදා	බදාදා	බ්‍රහස්පතින්දා	සිකුරාදා	සෙනසුරාදා	ඉරිදා
රතු කමිසය	රතු කමිසය	රතු කමිසය	නිල් කමිසය	නිල් කමිසය	රතු කමිසය	නිල් කමිසය
කළු කලිසම	කළු කලිසම	කළු කලිසම	නිල් කලිසම	කළු කලිසම	කළු කලිසම	කළු කලිසම

25. මෙම තොරතුරුවලට අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) එකම පාටින් යුතු කලිසමක් සහ කමිසයක් එක දිනයක හෝ ඇඳ නැත.


(2) සෑම දිනක ම කළු කලිසම ඇඳ ඇත.

(3) රතු කමිසය දින 4ක් ඇඳ ඇත.

26. පාසලේ අවුරුදු උත්සවයක දී ලිස්සන ගසට නගින ළමයකු මීටර 3ක් නඟින විට මීටර 1ක් පහළට ලිස්සා යයි. ගසෙහි උස මීටර් 6ක් නම් ගස මුදුනට නැගීමට හැකි වන්නේ කීවෙනි වාරයේදී ද ?

(1) 2 (2) 3 (3) 8

27. A රූපයේ දැක්වෙන්නේ කඩදාසියකි. එයින් B රූපයේ දැක්වෙන ආකාරයේ කුඩා කඩදාසි කැබලි කීයක් කපා ගත හැකි ද ?




(1) 8 (2) 9 (3) 10

28. බැංකුවක සිටින නිලධාරීන් 15 දෙනෙකු අතරින් 10 දෙනෙකු ළඟ කාර් ද, 8 දෙනෙකු ළඟ වෑන් ද තිබේ. ඔවුන් සෑම කෙනෙක් ළඟ ම කාර් එකක් හෝ වෑන් එකක් ඇත. දෙවර්ගය ම ඇති අය සිටිනම් එම ගණන කීය ද ?

(1) 3 (2) 5 (3) 8

29. දී ඇති හැඩතල ඇසුරෙන් තුනක් එකතු කර සෘජුකෝණාස්‍රයක් සෑදිය හැකි ය. ඒ හැඩතල මොනවා ද ?



(1) 1, 2, 3 (2) 2, 3, 4 (3) 4, 3, 5

30. කම්බියකින් සාදා ඇති පැත්තක දිග 12 cm ක් වූ සමපාද ත්‍රිකෝණයක් දිගහැර සමචතුරස්‍රයක් සෑදුවේ නම් සමචතුරස්‍රයේ පැත්තක දිග කීය ද ?

(1) 5 cm (2) 8 cm (3) 9 cm

31. යතුරුපැදි දෙකක් එක ම ස්ථානයකින් පටන්ගෙන එකිනෙකට විරුද්ධ දිශාවට 100 m බැගින් ගමන් කරයි. ඉන්පසු එක යතුරු පැදියක් දකුණු අත පැත්තටත් අනෙක් රථය වම් අත පැත්තට හැරී මීටර් 200 බැගින් ගමන් කරයි. දැන් රථ දෙක අතර දුර කොපමණ ද ?

(1) 300 m (2) 200 m (3) 600 m

- **හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

32. 8 18 28

18 28 38

28 38 ..... (1) 46 (2) 47 (3) 48

33. කපුටෙකු මිනිත්තු හතරකට වරක් ද, කුකුළෙකු මිනිත්තු 5 කට වරක් ද නාද කරයි. ඔවුන් දෙදෙනා ම පෙ.ව.7.50 ට එකවර නාද කරයි. නැවත දෙදෙනා ම එකවර නාද කරන වේලාව මින් කුමක් ද ?

(1) පෙරවරු 8.05 (2) පෙරවරු 8.10 (3) පෙරවරු 8.16

34. දුම්රිය නැවතුම් පොළක නවතා තිබුණු දුම්රිය දෙකක් එකිනෙකට ප්‍රතිවිරුද්ධ දිශාවලට පැයට කිලෝමීටර 20 ක හා පැයට කිලෝමීටර 40 ක වේගයෙන් ගමන් කරන ලදී. පැය දෙකකට පසු එම දුම්රිය දෙක අතර දුර කොපමණ ද ?

(1) 40 km (2) 120 km (3) 150 km

35. මීටර 10ක් දිග මීටර 5 ක් පළල බිත්තියක තීන්ත ගෑමට තීන්ත ලීටර 2 ක් අවශ්‍ය වේ. මීටර 20ක් දිග මීටර 10ක් පළල බිත්තියක තීන්ත ගෑමට අවශ්‍ය තීන්ත ප්‍රමාණය වන්නේ,

(1) ලීටර 4 (2) ලීටර 5 (3) ලීටර 8

36. පහත වගුවේ දැක්වෙන ළමුන්ගෙන් වයසින් අඩු ම ළමයා හා වයසින් වැඩි ම ළමයා පිළිවෙළින් තෝරන්න.

නම	උපන්දිනය
අජිත්	2024. 08. 23
මධුෂ	2024. 11. 13
හර්ෂ	2023. 11. 13
එෂාන්	2021. 06. 13

(1) අජිත් , හර්ෂ

(2) එෂාන් , මධුෂ

(3) මධුෂ , එෂාන්

37. පලතුරු වෙළඳසැලක අඹ ගෙඩි සංඛ්‍යාව මෙන් දෙගුණයක් අන්නාසි ඇත. අන්නාසි ගෙඩි සංඛ්‍යාව මෙන් දෙගුණයක් පේර ඇත. දිවුල් ගෙඩි සංඛ්‍යාව අඹ සහ අන්නාසි ගෙඩිවල එකතුවට සමාන වේ. වෙළඳසැලෙහි තිබෙන මුළු අඹ, අන්නාසි, පේර සහ දිවුල් ගෙඩි ගණන 80 ක් නම් එහි ඇති පේර ගෙඩි ගණන කීය ද?

(1) 16 (2) 24 (3) 32

38.

	පුත්තලම	මාතර
කොළඹ	132	
ගාල්ල	116	248
මාතර	45	161	-----

මාතර සිට පුත්තලමට දුර කීය ද ?

(1) 301 km

(2) 293 km

(3) 372 km

39. ශිෂ්‍යත්ව විභාගයේ පළමු ප්‍රශ්න පත්‍රයේ එක් පිළිතුරකට හිමිවන ලකුණු ප්‍රමාණය 2 යි 1/2 කි. රුසින්දුගේ පිළිතුරු 38 ක් නිවැරදි ය. රුසින්දුට හිමිවන මුළු ලකුණු ප්‍රමාණය කොපමණ ද ?

(1) 70 (2) 90 (3) 95

40. මෙම ඔරලෝසුවේ පෙන්නුම් කරන්නේ පෙරවරු වේලාවකි. මෙම වේලාවට පැය තුනයි මිනිත්තු 45 කට පසු වේලාව කීය ද ?



(1) ප.ව. 1.55

(2) පෙ.ව. 11.30

(3) ප.ව. 12.25

All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහනුවර
மத்திய மாகாண கல்வித்திணைக்களம் - கண்டி
CENTRAL PROVINCIAL DEPARTMENT OF EDUCATION - KANDY



5 ශ්‍රේණිය

සිසු නිපුණතා ඇගයීමේ පරීක්ෂණය

2025 මැයි

11 පත්‍රය

නම.....

කාලය පැය 1 යි මිනිත්තු 15 යි.

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

* ඔබේ **නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන් වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **නම** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. (සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත)
* පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් ඇඳින්න කියා ඇති විට **ඉරක් පමණක් ඇඳින්න.**
* පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් ඇඳින්න.**
* කටු වැඩ සඳහා කඩදාසියක් යොදා ගන්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

1 පහත දැක්වෙන ඡේදය කියවන්න.

අහස් තලයෙහි පැහැබර සඳ බැබළෙන්නට විය. රිදී පාට සඳ රැසින් මුළු වන පෙත ම සැනසෙන්නට පටන් ගත්තේ ය. වනදහන සතුටු කරමින් ගලා ගිය ගංගා කුමරිය තවත් හැඩ ගැනුණේ සඳ රැස් වැළඳ ගැනීමට මෙන් ය. මේ මනහර රාත්‍රියේ ගලා එන සිසිල් සුළඟින් මල් සුවඳ පැතිර ගියේ ය. ටිකෙන් ටික සඳ මෝරමින් ඉහළ අහසට නැගුනි. ඒත් සමග ම නිදි නොලැබූ කොවුලකුගේ මිහිරි නාදය පැතිරෙන්නට පටන් ගත්තේ මුළු වනය ම මිහිරියාවකට පත් කරමිනි.

● **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

(i) මෙම ඡේදයෙන් කියැවෙන්නේ දවසේ කුමන කාලයක් පිළිබඳව ද? .....

(ii) වන පෙත සැනසෙන්නට පටන් ගත්තේ කුමකින් ද? .....

(iii) වනය මිහිරියාවකට පත් වූයේ ඇයි?

.....

(iv) සඳ රැස් වැළඳ ගැනීමට හැඩ ගැනුණේ කුමක් ද? .....

(v) කැලෑව යන පදයට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. .....

(vi) මිහිරි නාදය පතුරුවන කොවුලා ඡේදයේ විස්තර කර ඇත්තේ කෙසේ ද?

.....

(vii) සිසිල් සුළඟින් පැතිර ගියේ කුමක් ද? .....

2. අතීත කාල පුරුෂ ලිංග ඒක වචන ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

ගොවියා / කළා ය / ලිව්වේ ය. / යමි / දුවති

3. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

අපි (සමනොල / සමනොළ) කන්ද නැරඹීමට තීරණය කළෙමු.

4. පහත සඳහන් වගන්තිවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(i) රැහැයි නාදය වනයේ පාළුව ..... (මැකුහ / මැකුවේ ය.)

(ii) සියලුදෙනා ම කැඳවා ගෙන යෑමට අත්තම්මා තීරණය ..... (කළහ / කළා ය)

(iii) සීයාගේ කතාව අපි අනුමත ..... (කළහ / කළෙමු)

(iv) බොහෝ අය අඹ පැණි රස බව ..... (පැවසුවේ ය / පැවසූහ)

(v) අයියාත් මල්ලිත් පාසල් යාමට සූදානම් ..... (වෙති / වූවේ ය)

5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

හරි අපූරු කතාවක්නේ මට කියවුණේ ඉඹේට ම ය

නම .....

6. පහත සඳහන් වාක්‍ය ලේඛන වහරට හරවා නැවත ලියන්න.

ඇය මකුළුවකු බවට හැරුණා.

.....

7. පහත සඳහන් වාක්‍යයේ උපමාව සොයා ලියන්න.

නිසංසල නදිය නිල් මිණි තලාවක් සේ බබළයි.

.....

8. හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) ..... හෙටට කල් නොදමන්න.

(ii) කට නිසා ..... වගේ.

9. යුගල පදය ලියන්න.

..... මනම්

10. පහත සඳහන් වාක්‍යය ස්ත්‍රී ලිංග බහුවචන වර්තමාන කාලයට හරවා ලියන්න'

කුරුල්ලා අඹ ගසට පියඹා ගියේ ය'

.....

11. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.


i) Boat - .....

ii) Cow - .....

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

i) 

.....

ii) 

.....

13. හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) How many flowers ..... There? (is / are)

(ii) Do you ..... a pet (have / has)


14. "මඤ්ජුල් නිරමි" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

15. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

පුස්තකාලය කොහේ ද? .....

16.පහත සඳහන් ගණක රාමුවේ නිරූපණය වන සංඛ්‍යාවට 10 ක් එකතු කළ විට ලැබෙන පිළිතුර ඉලක්කමෙන් ලියන්න.



.....

17. දී ඇති සංඛ්‍යාවට පෙර හා පසු සංඛ්‍යා ලියන්න.

..... 10 000 .....

18. ආරෝහණ පටිපාටියට ලියන්න.

5 942 , 9 524 , 5 294 , 2 954

.....

19. පහත සංඛ්‍යාවේ ස්ථානීය අගය පිහිටීම ලියන්න.

5803 = ... + ... + ... + ...

20. බාධක දිවීමේ තරගයක් සඳහා දිවීමට ඇති මුළු දුර මීටර 200 කි. ආරම්භක ස්ථානයේ සිට පළමු බාධකයට ඇති දුර මීටර 35 සෙන්ටිමීටර 60ක් වන අතර දෙවන බාධකයේ සිට තරගය අවසන් කරන ස්ථානයට ඇති දුර මීටර 60 යි සෙන්ටිමීටර 45 ක් නම් පළමු බාධකයේ සිට දෙවන බාධකයට ඇති දුර කොපමණ ද?

.....

21.පෙරවරු 9.00 ට පිටත් වීමට නියමිත දුම්රියක් මිනිත්තු 25 ක් ප්‍රමාද වී ගමන පටන් ගත්තේ ය. ගමනට ගත වූ කාලය පැය 5 මිනිත්තු 20 ක් නම් දුම්රිය ගමනාන්තයට ළඟා වූ වේලාව කීය ද?

.....

22. බොත්තම් 400කින් 68 ක් ඉවත් කර ගෙන ඉතුරු බොත්තම්, ඇඳුමකට 4 බැගින් අල්ලන ලදි. බොත්තම් අල්ලන ලද ඇඳුම් ගණන කීය ද?


.....

23.රුපියල් 200.00 බැගින් වූ අභ්‍යාස පොත් 2ක්, රුපියල් 60.00 ක් වූ පාට පෙට්ටියක් සහ රුපියල් 20.00 බැගින් වූ පෑන් 3ක් මිල දී ගැනීමට ඉමාෂට අවශ්‍ය විය ඔහු ළඟ ඇති මුදල රුපියල් 500. 00 කි. ඒ සඳහා ඔහුට තව කොපමණ මුදලක් අවශ්‍ය ද? .....

24. ජලය ලීටර 3ක් පිරවිය හැකි ටැංකියකින් බාගයක් පිරී තිබුණි. ටැංකිය සම්පූර්ණයෙන් ම පිරීම සඳහා මිනිත්තු 30ක් ගත වේ. ටැංකිය පිරීම සඳහා නැවත ජල කරාමය විවෘත කර මිනිත්තු 20ක් ගිය පසු අපතේ ගිය ජල ප්‍රමාණය කොපමණ ද? .....

25. 347 - 338 = ... පිළිතුර රෝම සංඛ්‍යාංකවලින් හිස්තැනෙහි ලියන්න.

26. පහත සඳහන් තරාදියේ බර සමාන වීම සඳහා වම් පසට දැමිය යුතු පඩි මොනවා දැයි ලියන්න.



27. සමචතුරස්‍ර පැති දෙකක් හා සෘජුකෝණාස්‍ර පැති හතරක් සහිත ඝනවස්තුවක ශීර්ෂ කීය ද?

.....

28. කොටුවේ ඇති සංඛ්‍යාවලින් ගැළපෙන සංඛ්‍යා යොදා ගෙන පොදු අන්තරය 6 වන සංඛ්‍යා රටාවක් ගොඩනගා ලියන්න.

12		31
	18	37
25		19


..... , ... , ... , ...

29. පාසලක එක් එක් ශ්‍රේණිවල සිටින පිරිමි හා ගැහැනු සිසුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ශ්‍රේණිය	පිරිමි	ගැහැනු
1	16	18
2	15	12
3	17	15
4	16	21
5	18	18

(i) මෙම පාසලේ වැඩි ම සිසුන් ගණනක් සිටින ශ්‍රේණිය කුමක් ද? .....

(ii) මෙම පාසලේ ගැහැනු ළමුන් පිළිබඳ තොරතුරු පහත සඳහන් ප්‍රස්තාරයේ දැක්වේ. ඒ අනුව 3 ශ්‍රේණියේ අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රස්තාරයේ නිරූපණය කරන්න.



- ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

30. ජාතික ගීය රචනා කරන ලද්දේ

1) ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා 2) ආනන්ද සමරකෝන් මහතා 3) එස්. මහින්ද හිමි

31. පත්‍රවල හැඩය අනුව එක ම වර්ගයකට අයත් ශාක පත්‍ර කාණ්ඩය වන්නේ,

1) බණ්ඩක්කා, දෙල් 2) සියඹලා, අනෝදා 3) කොස්, දඹ

32. ගෘහ ආශ්‍රිත පරිසරයේ ගැවසෙන සතෙකි.

1) හූනා 2) කුකුළා 3)එළදෙන

33. රෝග බෝ කරන, ආහාර අපිරිසිදු කරන සතෙකි.

1) කැරපොත්තා 3) මදුරුවා 3) ගෙමැස්සා

34. අපට වෙළඳ පොළෙන් මිල දී ගත හැකි සෞඛ්‍යයට හිතකර පාන වන්නේ,

1) කොළපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

2) රතුපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

3) කහපාට රවුමක් සංකේතවත් කර ඇති පාන

35. ජලය පිරිසිදු කර ගැනීමට අතීතයේ දී භාවිත කළ ඇට වර්ගයකි.

1) ඉඟිනි ඇට 2) කැකුණ ඇට 3) සියඹලා ඇට

36. කෙනෙකුගෙන් තවත් අයෙකුට රෝග බෝ වීමේ ඉඩකඩ ඇත්තේ

1) වෛද්‍ය ප්‍රතිකාර ගැනීමෙන්

2) මිනිසුන් ගැවසෙන ස්ථානවල වැඩි වශයෙන් රැඳී සිටීමෙන්

3) කැස්ස හා කිවිසුම් යාමේ දී ලේන්සුවකින් නාසය හා මුඛය ආවරණය කර ගැනීමෙන්

37. ආගන්තුක පුද්ගලයෙකු සමඟ කටයුතු කිරීමේ දී අනාරක්ෂිත බවක් හැඟුන හොත් අප නොකළ යුතු දෙයකි.

(1) විශ්වාසවන්ත අයෙකුට දැනුම් දීම (2) අහිතකර යෝජනා ප්‍රතික්ෂේප කිරීම

(3) කිසිවෙකුට නොදන්වා සිටීම

38. මෙම මාර්ග සලකුණ දැකිය හැකි ස්ථානයක් වන්නේ,



1) රෝහලක් අසල 2) පන්සලක් අසල 3) උසාවියක් අසල

39. මාසික වාර ප්‍රවේශ පත්‍ර ලබා ගෙන ගමන් කළ නොහැකි වාහනයකි.

1) දුම්රිය 2) බස්රිය 3) වෑන් රථය

40. පොදු ප්‍රවාහන සේවයේ ලක්ෂණයක් නොවේ.

1) ප්‍රවේශ පත්‍රයක් ලබා නොදීම. 2) කාලසටහනකට අනුව ගමන් කිරීම. 3) රාත්‍රියට පමණක් ගමන් කිරීම.

41. සිරිපා වන්දනා කිරීමට සහභාගී වන්නේ,

1) බෞද්ධයන් 2) හින්දු ආගමිකයන් 3) සියලු බැතිමතුන්

42. කාලයකට පමණක් මල් පිපෙන ශාක කාණ්ඩය වන්නේ,

1) ඇසළ, එරබදු, කෙසෙල් 2) පොල්, වදමල්, රබර් 3) තේක්ක, මැයි, එරබදු

43. පියාපත් සහිත" පාද ඇති" ශාක භක්ෂක" ක්ෂීරපායී සතෙකි.

1) ගිරවා 2) වවුලා 3) මයිනා

44. ඖෂධීය බීමක් ලෙස සකස් කර ගත හැකිය.

1) පිපිඤ්ඤා 2) වැල් පෙනෙළ 3) කරවිල

45. වැලි යට දැමීමෙන් හෝ ලුණු දැමීමෙන් කල් තබා ගත හැකි ආහාරයකි.

1) කොස් ඇට 2) දෙහි 3) සියඹලා


46. දිය හොල්මන වැදගත් වන්නේ කුමන කර්මාන්තය සඳහා ද?

1) ධීවර කර්මාන්තයට 2) කෘෂි කර්මාන්තයට 3) පතල් කර්මාන්තයට


47. රෝග වාහක පුද්ගලයන් මගින් බෝවන රෝගයක් නොවේ,

1) පැපොල 2) කොවිඩ් 19 3) කොළරාව


48. බල්බය දැල්වෙන අවස්ථාව වන්නේ,



A



B



C

1) B 2) C 3) A

49. සරල දිවි පැවැත්මක් සහිත පුද්ගලයෙකුට ලැබෙන වාසියක් වන්නේ,

(1) ආර්ථික අපහසුතා (2) විවේකී බව (3) අනාරක්ෂිත බව

50. සොරබොර වැව පිහිටා ඇති පළාත වන්නේ,

1) මධ්‍යම පළාත 2) උතුරු මැද පළාත 3) ඌව පළාත

51. කෘමි සතෙකු නොවන්නේ

1) බත්කූරා 2) මකුළුවා 3) කුඹියා

52. යකඩයකින් පිහියක් සාදා ගැනීමට යා යුතු ස්ථානය,

1) වඩු මඩුව 2) කම්මල 3) කර්මාන්ත ශාලාව

53. සතුන් මගින් ව්‍යාප්ත වන බීජයකි.

1) හොර 2) වම් ඇපල 3) කුඩළු

54. කාර්යයක් කිරීමේ දී කාලය හා ශ්‍රමය ඉතුරු කරගත හැකි ආකාරයකි.

(1) පිළිවෙළට නොකිරීම (2) ඉක්මනින් අවසන් කිරීම (3) සැලසුම්ගතව කිරීම

55. ශ්‍රී ලංකාවට ආවේණික මාළුවෙකි.

1) මල්පුලුට්ටා 2) දියනයා 3) ගුරාමි

56. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



1) ඔරලෝසුව 2) විරාම ඝටිකාව 3) මාලිමාව

57. ප්‍රෝටීන් සහිත ආහාර,

1) ශක්තිජනක ආහාර වේ. 2) වර්ධක ආහාර වේ. 3) ආරක්ෂක ආහාර වේ.


58. පිළිස්සීමක දී, ඒ අවස්ථාවේ ම කළ යුතු දෙයකි.

1) දන්තාලේප ආලේප කිරීම

2. පිලිස්සුණු තැන ආවරණය කිරීම

3) පිළිස්සුණු ස්ථානයට ගලා යන සේ ජලය දැමීම

59. මෙම රූපයෙන් දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,



1) පිස්මේන්තු මැස්ම 2) බ්ලැන්කට් මැස්ම 3) හුරුළුකටු මැස්ම

60. "රටට පිපෙන මල් අපි වෙමු " යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. .....

.....

2. .....

.....

3. .....

.....